# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 441 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 13 /03/2024<br>පැය 1220 | | |

## මාධ්‍ය නිවේදනය

**01. වන අලි ප්‍රහාරයකින් කාන්තාවක් මියයාම - මඩු පොලිස් වසම.**

2024.03.12 වන දින රාත්‍රී කාලයේදී මඩු පොලිස් වසමේ කට්ටෙඅඩප්පන් ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීමෙන් කාන්තාවක් මියගොස් ඇති බවට මඩු පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 27 ක් වන කට්වේඅඩප්පන් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය තම ස්වමි පුරුෂයා හා කුඩා දරුවෙකු සමඟ ඉහත ප්‍රදේශයේ පදිංචිව සිට ඇත. වන අලියෙකු පැමිණීම හේතුවෙන් ආරක්ෂාව සඳහා කාන්තාව නිවසින් එළියට පැමිණ කුඩා දරුවා සමඟ යාබද නිවසට දිව යාමේදී වන අලි ප්‍රහාරයට ලක්ව ඇති බව අනාවරණය වී ඇත.

එම අවස්ථාවේදී තුවාල ලැබූ කුඩා දරුවා මන්නාරම රෝහලට ඇතුලත් කර ඇත. මඩු පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පනාමුර පොලිස් ස්ථානය.**

2024.03.12 වන දින සවස් කාලයේදී පනාමුර පොලිස් වසමේ බංඩොක්කයාය ප්‍රදේශයේදී පනාමුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන සුදුගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පනාමුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තණමල්විල පොලිස් ස්ථානය.**

2024.03.12 වන දින සවස් කාලයේදී තණමල්විල පොලිස් වසමේ කහකුරුල්ලන්පැලැස්ස ප්‍රදේශයේදී තණමල්විල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින්

ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ගංජා කිලෝග්‍රෑම් 05 ග්‍රෑම් 910 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වූ කහකුරුල්ලන්පැලැස්ස, තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. සැක කටයුතු මරණයක් - ඉමදූව පොලිස් වසම.

2024.03.12 වන දින රාත්‍රී කාලයේ ඉමදූව පොලිස් වසමේ හවුපේ ප්‍රදේශයේදී පුද්ගලයෙකු සැක සහිත ලෙස මියගොස් ඇති බවට ඉමදූව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ මීගහගොඩ, අහංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ එම ස්ථානයේ ඇති අතර 2024.03.13 වන අද දින මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇත. ඉමදූව පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹගල්ල පොලිස් ස්ථානය.

2024.03.12 වන දින සවස් කාලයේ දී දඹගල්ල පොලිස් වසමේ බුද්ධම ප්‍රදේශයේ දී දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදුකල වැටලීමකදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන මීයාගල, බුද්ධම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - බලංගොඩ පොලිස් වසම.

2024.03.12 වන දින උදෑසන කාලයේ බලංගොඩ පොලිස් වසමේ කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයේ අලුත් නුවර ප්‍රදේශයේදී පානදුර දෙස සිට මහියංගනය දෙසට ධාවනය වූ ලංගම බස් රථයක් තුල සිටි මඟී කාන්තාවක් පිටුපස දොරෙන් එළියට විසිවී බරපතල තුවාල ලබා බලංගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 73 ක් වූ තල්පොත, ගැමුණුපුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර බලංගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කොටහේන පොලිස් වසම.

2024.03.12 වන දින උදෑසන කාලයේ කොටහේන පොලිස් වසමේ සංඝරාජ මාවතේ පැරඩයිස් හංදිය අසලදී පිටුපසට ධාවනය කල ලොරි රථයක් පදික මාරුවකින් ගමන් කරමින් සිටි පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර උස අඩි 05 ක් පමණ, වයස අවුරුදු 80 ත් 85 ත් අතර පුද්ගලයෙකි.**

අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කොටහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**